සබරගමුව පළාත් සභාව - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary } Office – 045 2223015

කාර්යාලය / Office } නවනගරය, රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number }

ඔබේ අංකය / உமது இல / Your Number }

දිනය / திகதி / Date }

සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක :
සබර/2023/02

## දිවා කාලයේදී පාසල් ක්‍රීඩාපිටි විවිධ වැඩසටහන් සඳහා ලබාදීම

පාසල තුල අධ්‍යාපනික කටයුතු හා ඊට අදාල බාහිර ක්‍රියාකරකම් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

02. බොහෝ අවස්ථාවන්හිදී රජයේ ආයතන සහ ඇතැම් බාහිර පාර්ශවයන් විසින් විවිධ වැඩ සටහන් සඳහා පාසල්වල ක්‍රීඩාපිටි ලබාදෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි. එවැනි ඉල්ලීම් ලැබුනහොත් ඒ සම්බන්ධව වහාම එහි යෝග්‍යතාවය හා අවශ්‍යතාවය සලකා බලා පාසලේ මානව හා භෞතික සම්පත් ආරක්ෂා වන පරිදි එම වැඩසටහන් සඳහා මටද පිටපතක් සහිතව ඔබගේ අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. එමෙන්ම ඉදිරිපත් වන ඉල්ලීමේ ස්වභාවය අනුව හා ක්‍රීඩා පිටියේ පවතින පහසුකම් සහ එහි ධාරිතාවය සැලකිල්ලට ගෙන අවමය රු.5000/- ක සිට රු.15000 - දක්වා උපරිමයක් වන ලෙස තැන්පතුවක් පාසල් සංවර්ධන සමිති ගිණුමේ රඳවා ගැනීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වන ඔබ විසින් කටයුතු කලයුතුය. අදාල වැඩසටහන අවසන් වීමෙන් පසු එසේ තැන්පත් කල මුදලින් 10% ක මුදලක් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කිරීමට කටයුතු කරන ලෙස සබරගමුව පළාතේ සියළුම පළාත් පාසල් වල විදුහල්පතිවරුන් ලිඛිතව දැනුවත් කරන මෙන් ඔබට වැඩිදුරටත් දන්වමි.

04. මෙසේ පාසල ක්‍රීඩාපිටි ලබාදිය දිවා කාලයේදී පමණක් සිදුවිය යුතු අතර, අදාල පාසලේ විදුහල්පති විසින් මෙම කාරණ සම්බන්ධයෙය සියළු වගකීම දැරිය යුතුබව දන්වමි. ඔබගේ අනුමැතියක් නොමැතිව පාසල් ක්‍රීඩා භූමි තුළ කිසිදු බාහිර වැඩ සටහනක් ක්‍රියාත්මක නොකල යුතු බව මින් අවධාරණය කරමි. මගේ අංක ME/E/02 ( සබර/චක්‍රලේඛ ) / පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක : සබර/2022.02 (1) හා 2022.12.20 දරණ චක්‍රලේඛය තවදුරටත් වලංගු වේ. එහි පිටපතක් මේ සමග එවමි. එමෙන්ම මගේ අංක : සබර/2022/02 හා 2022.04.01 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරන බව දන්වමි.

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර

සුජානි ආර්.විජේතුංග.
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමු පළාත් සභාව.

පිටපත් 01. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.
02. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, ස.ප.ස. - කා.දැ.පි.
03. සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - කා.දැ.පි. හා අ.කා.ස.
04 නියෝජ්‍ය පොලිස්පති ,රත්නපුර/කෑගල්ල - කා.දැ.පි. හා අ.කා.ස.
05. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , රත්නපුර/ඇඹිලිපිටිය/කෑගල්ල/සීතාවක - කා.දැ.පි. හා අ.කා.ස.